# රාමායණ මිත්‍යා සංචාරයෙන් උද්ගතවන විදේශ ප්‍රතිපත්ති ප්‍රශ්න

## බන්දු ද සිල්වා

ඉන්දියාවේ ප්‍රාන්ත රාජ්‍යයක මහ ඇමතිවරයකු ශ්‍රී ලංකාවේ සීතා මහා කෝවිලක් ඉදි කිරීම සඳහා භූමි පූජා උත්සවයේ ප්‍රධානත්වය දැරීම එතරම් භාරදූර දෙයක් ලෙස නොපෙනෙනු ඇත. මන්ද? ශ්‍රී ලංකා රජයේ අංශ විසින් රාමායණ මිථ්‍යා සංචාරක ව්‍යාපාරයට අනුබල දීම නිසාත් එයින් එය රජයේ ප්‍රතිපත්තියක් වන බව පිළිඹිබු වන නිසාත්ය. එහෙත් ඉන්දියන් රජය විසින් මෙවැනි අවස්ථාවල දී ගනු ලබන ස්ථාවරය මෙය විය නොහැක. බුද්ධගයාවෙහි නිවාස නොමැති අයට නිවාස තනා දීමට ජනාධිපති ආර්. ප්‍රේමදාස මැතිතුමා සිරිසේන කුරේ ඇමතිතුමා යැවූ විට එයට ඉන්දියන් රජයෙන් සුහද ප්‍රතිචාරයක් නොලැබිණි. හිටපු ඉන්දියන් මහ කොමසාරිස් ජේ. ඇන්. ඩික්සිත් මහතා එය අනවශ්‍ය අක්‍රාන්තියක් ලෙස සැලකීය.

නමුත් ඉන්දියානු මහ ඇමතිතුමාගේ මැදිහත් වීම සිදු වූයේ සහස්‍ර දෙකක් තිස්සේ වාල්මිකි විසින් සම්පාදිත රාමායණය සම්ප්‍රපලාපයක් ලෙස සැලකූ රටකය. එනම් 5 වන ශත වර්ෂයේ දී ප්‍රසිද්ධ ඉන්දියානු චෝල භික්ෂු අටුවාචාරි බුද්ධඝෝෂ හිමියන් ලියූ අටුවා වල සම්ප්‍රපලාප යනු කුමක්දැයි පැහැදිලි කිරීමට රාමායණය උදාහරණයක් ලෙස ඉදිරිපත් කළ තැන් සිට ය.

ස්ථාන නාම වල නිරුක්ති හා ජන කතන්දර ඒ සම්බන්ධ ඓතිහාසික සත්‍ය ලෙස අර්ථ නිරූපණය කිරීමෙන් සාම්ප්‍රදායික ඉතිහාසය හා ප්‍රධාන ආගම් යටිකුරු කර දැක්වීමට කරන උපක්‍රමික ප්‍රයත්නයක් පැහැදිලි වේ. (කිරිඇල්ල නම් කෙනෙක් පොතක් මගින් එසේ කරන බව පැහැදිලිවම ප්‍රකාශ කොට ඇත .)

බලවත් අර්බුදයක් පැන නගින්නේ සෛවරී රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකාවේ දේශපාලන අනන්‍යතාවට හානි පැමිණෙන ලෙස ඓතිහාසික තත්වය විකෘති වීම නිසාය. රටේ සෛවරී තත්වය ගොඩ නැගී ඇත්තේ ඓතිහාසිකව ආවේණික වූ ස්වංශක්තිය හා ඒකාබද්ධතාව මතය. මේ මූලධර්ම ක්ෂය වීමට ඉඩ හැරියොත් ජාතිකත්වයට ඇති හිමිකම් ක්ෂය වී මේ රට අසීමිතව තමන්ට උවමනා විධියට බෙදුම්වාදයකට ලක් කිරීමට හා සූරා කෑමට පත් වෙනු ඇත .

රාමායණ මිථ්‍යා සංචාරක ව්‍යාපාරය නිසා ගැටුම් ඇතිවන තත්වයක් උද්ගත විය හැකි වන්නේ මේ නිසාය. මෙම ව්‍යාපාරය නිසා ඇදි එන්නේ සාමාන්‍ය සංචාරකයන් නොවේ. රාම හා සීතාගේ උත්තරීතර භාවයෙන් උද්දාම වූ ආගමික අන්තවාදීන් ය. වෙනත් රටවල එවැනි වන්දනාකරුවන් නිසා ඇතිවී ඇති ගැටලු ගැන සිත යොමු කළ යුතුව ඇත . ෂියා මුස්ලිම්වරුන් වන ඉරාන ජාතිකයන් හජ් වන්දනාවේදීත් සුන්නි මුසල්මානුවන් මේෂාද් නුවර වන්දනාවේ දීත් ඇති කරන ගැටුම් උදාහරණ වේ.

ඉන්දියානු අනුග්‍රහය යටතේ නව සීතා මහා කෝවිලක් මෙහි ඉදි කිරීම ශ්‍රී ලංකාව හෝ වෙනත් බෞද්ධ රටක් ඉන්දියාවේ බෞද්ධ සිද්ධස්ථානවලට අයිතිවාසිකම් ඉල්ලීමට වඩා අයහපත් තත්වයක් ඇති කිරීමක් වේ.

ශ්‍රී ලංකාවේ දෙමළ ප්‍රශ්නය සමස්ත ඉන්දියානු හින්දු ප්‍රශ්නයකට හැරවීමට තැත් දරණ BJP පක්ෂය නිසා ඉන්දු ශ්‍රී ලංකා සම්බන්ධතාවලට මුහුණ පාන්නට විය හැක්කේ ඉතාමත් අසතුටුදායක තත්වයකි. සීතා මහා කෝවිල ඉදි කිරීමට BJP පක්ෂයේ මැදිහත් වීම සැකයට පාත්‍ර වේ. සාම්ප්‍රදායික ඓතිහාසික තත්වයටත් බෞද්ධ විශ්වාසයන්ටත් මේ නිසා එල්ල වන අභියෝගයට අමතරව බලපෑම් කළ හැකි සන්ධිස්ථානයක් බිහි වීමද වැළැක්විය නොහැක. දැනටමත් තමිල්නාඩු ප්‍රාන්තයේ පිළිබිඹු වන අවිචාරවත් දෙමළ ජාත්‍යාලය නිසා බලවත් ප්‍රශ්න වලට ශ්‍රී ලංකාවට මුහුණ පෑමට සිදු වී ඇත . හින්දු ආගමික බලපෑමක් ඇති වුවහොත් ඒ නිසා ඇති විය හැක්කේ ඊටත් වඩා බලවත් අප්‍රසන්න ප්‍රතිඵලවලට මුහුණ දීමටය.